ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**

---

# විශේෂ නිවේදනයයි

## බාහිර උපාධි පරීක්ෂණ සඳහා ලියාපදිංචි වී විදේශගතව සිටින උපාධි අපේක්ෂකයන් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පරීක්ෂණ පැවැත්වීම

බාහිර උපාධි පරීක්ෂණ සඳහා ලියාපදිංචි වූ එහෙත් විදෙස්ගත වීමට සිදුවී ඇති අපේක්ෂකයින්ගේ ඉල්ලීම් පරිදි මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පරීක්ෂණයන්ට පෙනී සිටීමට අවස්ථාව ලබා දීමට බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ කළමනාකරණ කමිටුව විසින් තීරණය කර ඇත.

එම අධීක්ෂණ මාර්ගගත පරීක්ෂණයේ (**Online Supervised Examination**) එක් විෂයයක් සඳහා රු. 25000/- ක මුදලක් ආවරණය වන පරිදි ඒ අවස්ථාවේ පවතින විනිමය අනුපාතය අනුව අදාළ ඩොලර් ප්‍රමාණය අය කරනු ලැබේ.

මේ වන විට කාලසටහන් පළ කර ඇති බාහිර උපාධි පරීක්ෂණ සඳහා උක්ත ක්‍රමවේදය ඔස්සේ පෙනී සිටීමට අපේක්ෂා කරන විදේශගතව සිටින සිසුන් විභාගය පැවැත්වෙන දිනට දින 07 කට පෙර පහත දක්වා ඇති **Google** පෝරමය සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2023-06-15